VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 Police Park Place, Colombo 05, Sri Lanka
Tel: + 94 112055544; Fax: +94 719379567
Email: reception@veriteresearch.org

# මිරිඟුවක් කරා හඹායන ආර්ථික වර්ධන සිහිනය පිළිබඳ විග්‍රහයක්

මෑතකදී පැවැත්වූ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ආර්ථික සමුළුවේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය පිළිබඳ ඇති සුභවාදී බලපොරොත්තු පිළිබඳව කතිකාවතක් පැවැතින. එහිදී ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඒක පුද්ගල ද.දේ.නි) 2004-2009 කාල පරාසය තුළ දෙගුණයක් බවට පත්වූ බවත් නැවත 2015 දී එය දෙගුණ වෙමින් 2020 පමණ වන විට ඇමරිකානු ඩොලර් 9,000 ක මට්ටමක් දක්වා ඉහළ යන බවට කරුණු ඉදිරිපත් කෙරිණි.

ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදනය පිළිබඳ මෙම දත්ත ඉතා ආකර්ශනීය වන අතරම එමඟින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය ඉතා සාර්ථක වර්ධනීය ගමන් මගක සිටින බවට ද අදහසක් ගෙන දේ. නමුත් මෙම කරුණු නොමඟ යවන සුළු වේ. ආර්ථික විද්‍යාත්මක සංකල්ප දෙකක් අවබෝධ කර ගැනීම තුළින් මෙම ආර්ථික වර්ධනය පිළිබඳ මිරිඟුව සැබෑවක් නොවන බවත් ආර්ථිකය තුළ සැබෑ ලෙසම සිදුවන්නේ කුමක්ද යන කරුණ පිළිබඳවත් අවබෝධයක් ලබාගත හැක.

**නාමික සහ සැබෑ ආර්ථික වර්ධනය අතර වෙනස**

ආර්ථික විද්‍යාඥයින් විසින් ආර්ථික වර්ධනය පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමේදී දළ දේශීය නිෂ්පාදිතයෙහි නාමික සහ සැබෑ වර්ධන අගයන් හි වෙනසක්ම් පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. දළ දේශීය නිෂ්පාදිතයේ නාමික වර්ධනය යනු යම් නිශ්චිත කාල සීමාවන් දෙකක් අතර ආර්ථිකයෙහි නිෂ්පාදනය කරන ලද සියළුම භාණ්ඩ හා සේවා වල අගයෙහි ප්‍රතිශතය වැඩිවීම වෙළඳපොලෙහි දැන් පවතින මිල ගණන් වල වැඩි වීමයි. දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය ආකාර දෙකකට සිදුවිය හැකිය. 1.) වෙළඳපොල තුළ නිෂ්පාදනය වූ භාණ්ඩ හා සේවා ප්‍රමාණයෙහි සැබෑ වැඩි වීම 2.) වෙළඳපොලෙහි නිෂ්පාදනය වූ භාණ්ඩ හා සේවා වල මිල ගණන් වල වැඩිවීම.

මෙම කරුණු දෙක පිළිබඳව අවධානය යොමු කිරීම මගින් නාමික සහ සැබෑ වර්ධනයෙහි පවතින වෙනසක්ම් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වේ. නාමික ද.දේ.නි.යේ වර්ධනය සඳහා නිෂ්පාදන ධාරිතාවය වැඩිවීම සහ මිල ගණන් ඉහළ යාම යන සාධක දෙකම බලපානු ලබන අතර ද.දේ.නි.යේ සැබෑ වර්ධනය සඳහා නිෂ්පාදන ධාරිතාව ඉහළ යාම පමණක් බලපානු ලැබේ.

මෙම වෙනස වැදගත් වනුයේ සැබෑ ආර්ථික වර්ධනය සඳහා නිෂ්පාදන ධාරිතාවය ඉහළ යාම තුළින් ඇතිවන ද.දේ.නි.යේ සැබෑ වර්ධනය පමණක් හේතු සාධක වන බැවිනි. නිෂ්පාදන ධාරිතාවයේ වර්ධනයකින් තොරව සිදුවන නාමික ද.දේ.නි.යේ වර්ධනය හුදෙක් භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහළ යාමේ ප්‍රතිඵලයකි. එමනිසා රටක ආර්ථික වර්ධන දත්ත ඉදිරිපත් කිරීමේදී ද.දේ.නි.යේ සැබෑ වර්ධනය යොදාගනු ලැබේ.

නමුත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්තිමය හා මාධ්‍යය අවකාශයන් තුළ ආර්ථික වර්ධන කතිකාවත ඇමරිකානු ඩොලර් පාදක කොට ගැනීම නිසා ශ්‍රී ලංකා ආර්ථිකයේ නාමික වර්ධනය සැබෑ වර්ධනයක් ලෙස හඟවනු ලැබේ.

රජයේ ආර්ථික විශ්ලේෂකයන් විසින් ද.දේ.නි.යේ අවධමනයකය (GDP Deflator) ලෙස හැඳින්වෙන ආර්ථිකයේ මිල ගණන් ඉහළ යාම පිළිබඳ තක්සේරුවක් ලබාදෙන දර්ශකයක් සකස් කරනු ලැබේ. ඒ අනුව අවධමනකය යනු ද.දේ.නි.යේ නාමික සහ සැබෑ වර්ධනය අතර වෙනසයි. අවධමනකයේ අගය වැඩිවීම මගින් ද.දේ.නි.යේ නාමික සහ සැබෑ අගය අතර පරතරය ද ඉහළ යනු ලැබේ. අවධමනකය ආර්ථිකයේ පවතින උද්ධමනය පිළිබඳ මිනුම් දඬුවක් ද සපයයි. උද්ධමන දර්ශකය මගින් සාමාන්‍යයෙන් තෝරාගත් භාණ්ඩ හා සේවා මල්ලක් නිශ්චිත කාල සීමාවක් තුළ මිල ගණන් ඉහළ යාම පිළිබඳ සාමාන්‍ය අගයක් ලබා දේ. නමුත් අවධමනකය මගින් ආර්ථිකය තුළ නිෂ්පාදනය කරන ලද සියළුම භාණ්ඩ හා සේවා වල මිල ගණන් ඉහළ යාම පිළිබඳ සාමාන්‍ය අගයක් ලබා දේ.

**ආර්ථික වර්ධනය පිළිබඳ මිරිඟුව තුළින් සඟවා තැබෙන කටුක යථාර්ථයන් තුනක්**

පළමුව එමගින් ඒක පුද්ගල ද.දේ.නි.යේ සැබෑ වර්ධනය ඩොලර් මගින් දක්වා ඇති නාමික ඒක පුද්ගල ද.දේ.නි.යෙන් 1/3 ක් වැනි අඩු  අගයක් ගන්නා බව සඟවයි. සත්‍ය වශයෙන් ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හා සේවා පරිභෝජනය කරනු ලබන පුද්ගලයින්ට වැදගත් වනුයේ ඇමරිකානු ඩොලර් මගින් දක්වනු ලබන වර්ධනය නොව රුපියල් මගින් මැන දක්වෙන සැබෑ නිමවුම් වර්ධනය යි.

දෙවනුව එමගින් ඇමරිකානු ඩොලරයේ සිදුවන මිලදී ගැනීමේ හැකියාව අඩුවීම සඟවා තැබේ. උද්ධමනය හේතුවෙන් ඇමරිකානු ඩොලරයේ සැබෑ අගය ක්ෂය වීමකට භාජනය වේ.

තෙවනුව එමගින් ඩොලර් මගින් දක්වන වර්ධන අගයෙහි පවතින සංවේදීභාවය පිළිබඳ කරුණු සඟවා තබයි. එයට බලපාන හේතුව වන්නේ රුපියල හා ඇමරිකානු ඩොලරය අතර පවතින විනිමය අනුපාතයෙහි ක්ෂණික වෙනස්වීමක් මගින් වර්ධන අගය ද එසැනින් වෙනස් වීමකට ලක් වීමයි. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් විදේශ විනිමය අනුපාතයෙහි හදිසි වෙනසක්ම් සිදුකළ අවස්ථාවන් සඳහා දිගු ඉතිහාසයක් පවතී (රූප සටහන 01). මේ අනුව 2004-2009 කාල පරාසය තුළ ද.දේ.නි.යේ වර්ධනය දෙගුණයකින් ඉහළ ගොස් නොමැති අතර සැබෑ ලෙසම ඉහළ ගොස් ඇත්තේ 25% ක් පමණි.

2010 දී ශ්‍රී ලංකා ඒක පුද්ගල ද.දේ.නි. පසු අවුරුදු කාල පරාසයක් තුළ (2004 සිට 2009 දක්වා) දෙගුණයකින් ඉහළ නංවා ගැනීමට හැකි වූ බවට කරුණු ඉදිරිපත් කරන ලදී. ඇමරිනු ඩොලර් මගින් දක්වන ඒක පුද්ගල ද.දේ.නි. මෙම කාල පරාසය තුළ 93.5% ක වර්ධනයක් සටහන් කරන ලදී (රූප සටහන 02). නමුත් රුපියල් මගින් දක්වන ඒක පුද්ගල ද.දේ.නි.යේ සැබෑ වර්ධනය

27.4% ක් වැනි ඉතා පහල මට්ටමක පැවතින (එනම් ඇමරිකානු ඩොලර් මගින් දක්වා ඇති වර්ධනයයෙන් 1/3ක වත් වඩා අඩු අගයක් ගන්නා ලදී).

**2009-2015 කාල පරාසය තුළ ද.දේ.නි. දෙගුණයකින් ඉහළ නොයනු ඇත. උපරිම වශයෙන් 50%ක වර්ධනයක් අත්පත් කරගනු ඇත.**


2015 දී ඇමරිකානු ඩොලර් 4000 ක ඒක පුද්ගල ද.දේ.නි. මට්ටමක් කරා ලඟා වීමට නම් ඒක පුද්ගල ද.දේ.නි. 2009 පැවති මට්ටමේ සිට නැවත දෙගුණයකින් ඉහළ නංවා ගත යුතු වේ. විනිමය අනුපාතය ස්ථාවර මට්ටමක පැවතියේ නම් වර්තමාන පුරෝකථන වලට අනුව ඒක පුද්ගල ද.දේ.නි. 2009-2015 කාලය තුළ දෙගුණයක් වීමට ඉඩ තිබිණි. නමුත් මෙය මිරිගුවක් පසුපස හඹා යාමක් වේ. ඉතා සුභවාදී අනාගත දැක්මකින් යුතුව 2014, 2015 ඉදිරි වර්ෂ සඳහා පුරෝකථන සිදු කළ ද (එනම් 7.5% සැබෑ ආර්ථික වර්ධනයක් හා 6% අවධමනයක අගයක්) සැබෑ ඒක පුද්ගල ද.දේ.නි ඇමරිකානු ඩොලර් මගින් සඳහන් කොට ඇති අගයෙන් අඩක පමණ වර්ධනයක් පමණක් අතකර ගැනීමට සමත් වනු ඇත.

**2015 අපේක්ෂිත වර්ධන සිහිනය සැබෑ කර ගැනීමට 2026 තෙක් බලා සිටීමට සිදුවනු ඇත.**

2004 දී ඒක පුද්ගල ද.දේ.නි. ඇමරිකානු ඩොලර් 1063ක් වූ අතර ඇ. ඩොලර් සමග අනුපාතිකය 101.19ක් පමණ විය. 2015 දි ඒක පුද්ගල ද.දේ.නි. ඇමරිකානු ඩොලර් 4000ක මට්ටිමකට ගෙන ඒමට 2004 පැවති මට්ටම හතර ගුණයකින් පමණ (එනම් 3.75 ක ගුණිතයක්) පමණ ඉහළ නංවා ගත යුතු වේ. නමුත් ඉතාම සුභවාදී පුරරෝකථනයක් මත පිහිටා වුව ද සැබෑ ඒක පුද්ගල ද.දේ.නි. ඇමරිකානු ඩොලර් 4000 ක මට්ටමකට ගෙන ඒමට 2026 වන තෙක් බලා සිටීමට සිදුවන ඇත (රූප සටහන 02).

මීට පෙර අප ඉදිරිපත් කරන ලද *"සිංගප්පූරු චින්තනය ශ්‍රී ලංකාවට පූර්වාදර්ශයක් විය හැකිද?"* යන විශ්ලේෂණය මගින් ඇමරිකානු ඩොලර් 4000 ක ඒක පුද්ගල ආදායම් මට්ටම 2026 වන තෙක් සාක්‍ෂාත් කරගත නොහැකි බවට කරුණු ඉදිරිපත් කරන ලදී. මෙමගින් අප සැබෑ ලෙසම අදහස් කළේ ඒක පුද්ගල ද.දේ.නි.යේ සැබෑ වර්ධනය පිළිබඳවය. රජය විසින් ඉදිරිපත් කර ඇති පුරෝකථන මගින් ඒක පුද්ගල ද.දේ.නි. 2004 දී පැවති මට්ටමේ සිට 2015 වන විට හතර ගුණයකින් ඉහළ නංවා ගත හැකි බව දක්වා ඇත. නමුත් මෙම විශ්ලේෂණය මගින් ඉදිරිපත් කරන කරුණු මගින් ඒක පුද්ගල ද.දේ.නි. 2004 පැවති මට්ටමේ සිට ඇමරිකානු ඩොලර් 4000 ක මට්ටමක් දක්වා සැබෑ වර්ධනයක් අත්පත් කර ගැනීමට (එනම් ඉතා සුභවාදී ආර්ථික පුරෝකථන මත පිහිටා) වර්ෂ 2026 දක්වා කල් ගත වන බවට කරුණු ඉදිරිපත් කෙරේ.

රූප සටහන 01 - වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතයෙහි වාර්ෂික වර්ධනය (රුපියල් හා ඇමරිකානු ඩොලර් අතර)




රූප සටහන 02 - සත්‍යය සහ මිරිඟුව අතර වෙනස මැන දැකීම

| කාල සීමාව | | **සත්‍යය**<br>**(2004 මිල ගණන් අනුව) රුපියල් මගින් දක්වන සැබෑ ඒක පුද්ගල ද.දේ.නි.යේ වර්ධනය** | **මිරිඟුව**<br>**ඇමරිකානු ඩොලර් මගින් දක්වන නාමික ඒක පුද්ගල ද.දේ.නි.යේ වර්ධනය** |
|---|---|---|---|
| 2004-2009 | අවුරුදු 5<br>2004<br>2009 | 27.4%<br>රුපියල් 107,581<br>රුපියල් 137,015 | 93.5%<br>ඇමරිකානු ඩොලර් 1,063<br>ඇමරිකානු ඩොලර් 2,057 |
| 2009-2015<br>(පුරෝකථන ඇතුළත්ව) | අවරුදු 6<br>2015 | 49.6%<br>රුපියල් 205,033 | 100%<br>ඇමරිකානු ඩොලර් 4,114 |
| වටිනාකම සහ 275% ක වර්ධනයක් අත්කර ගැනීමට ගතවන කාලය | | රුපියල් 403,428<br>වර්ෂ 2026 න් ඔබ්බට | ඇමරිකානු ඩොලර් 4,114<br>වර්ෂ 2015 දී |

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**

**ඔබගේ අදහස් insights@veriteresearch.org වෙත විද්‍යුත් තැපැල් මාර්ගයෙන් යොමු කරන්න.**